**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය - 2013**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, ස්කන්ධය හා වගකීම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරි පනතේ V කොටසේ අංක 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්ථාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ආයතනයේ පැවැත්ම

2013 අංක 01 දරන දිවිනැගුම පනත මඟින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතට පත්වී ඇති අතර 2014 ජනවාරි 03 දින සිට මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු ආරම්භ කර තිබුණි. එසේ වුවද අධිකාරියේ ඈවර කිරීමේ කටයුතු 2014 ජුලි වන විටත් නිමකර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ගිණුම් ප්‍රතිපත්ති අංක 11 ප්‍රකාරව, “වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කර ඇත” ලෙස දක්වා තිබූ නමුත් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි රු.25,678,957 ක හර ශේෂ හා රු.1,370,442,148 ක බැර ශේෂ හඳුනාගැනීමෙන් පසුව අතීතානුයෝගීව ගැලපීම් කිරීම වෙනුවට ඉදිරියට ගෙනා ඌනතාවයට ගලපා තිබුණි.

(ආ) ප්‍රමිති අංක 03 හි 7 වැනි ඡේදය ප්‍රකාරව ගනුදෙනු, අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළයුතු වන්නේ ඒවා සම්බන්ධිත කාලපරිච්ඡේදය තුළ වුවද බැංකු මූල්‍ය අංශයේ ඉකුත් වර්ෂයට අදාළ රු.12,483,665 ක් සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම්වල ඇතුළත් කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2012 මාර්තු අවසානය දක්වා කාලපරිච්ඡේදයේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම්, අධිකාරියේ ආයෝජන වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් 2012 අප්‍රේල් සිට එම ඉතිරිකිරීම් සමෘද්ධි මහ සංගම්වල ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් වලින් කොටසක් අධිකාරියේ ගිණුම්වලද ඉතිරිය මහ සංගම් ගිණුම්වලද ඇතුළත්ව ඇතත් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අධිකාරියේ වත්කම් සඳහා පවත්නා ක්ෂය ප්‍රතිපත්තිය අනුව ගොඩනැඟිලි සඳහා ඉදිකළ වර්ෂයේ සිට ක්ෂය ගණනය කරනු ලබන නමුත් බැංකු මූල්‍ය අංශයේ ගොඩනැඟිලි සඳහා ඉදිකළ වර්ෂයට පසු වර්ෂයේ සිට ක්ෂය ගලපා තිබුණි. එසේම පරිගණක වැනි උපකරණ සඳහා

අධිකාරිය හා බැංකු මූල්‍ය අංශය විසින් එකිනෙකට වෙනස් ප්‍රතිශතයන් යටතේ ක්ෂය කර තිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැංකු මූල්‍ය අංශය විසින් ගොඩනැගිලි සඳහා රු.29,455,000 ක් අඩුවෙන් ක්ෂය ගිණුම් ගතකර තිබූ අතර උපකරණ සඳහා රු.122,035 ක ක්ෂය ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී බැංකු සංගම් 05 ක් සඳහා එකතුව රු.5,276,248 ක ඉඩම් මිලදී ගෙන තිබුණ ද ක්ෂය නොවන වත්කමක් වූ ඉඩම් වටිනාකම ගිණුම්වලින් වෙනම නිරූපනය නොකර ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් ක්ෂය ගණනය කිරීම ද නිවැරදි නොවීය.

(ඇ) බැංකු මූල්‍ය අංශයේ පරිපාලන වියදම්වලින් කොටසක් ආවරණය කර ගැනීම සඳහා ලාභ ලබන සමෘද්ධි බැංකු සංගම් විසින් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් එවා තිබුණු රු.12,924,674 ක් ඉදිරියට ගෙනා රඳවාගත් ලාභයට ගැලපීම වෙනුවට ජංගම නොවන බැරකම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව දිස්ත්‍රික්ක 04 ක සමෘද්ධි සේවකයින්ගේ රු.49,345,487 ක ණය වාරික අයකිරීම් 2014 ජූනි වන විටත් ඔවුන්ගේ කේවල ගිණුම්වලට පිටපත් කර නොතිබුණි.

### 2.2.5 නොසැසඳු පාලන ගිණුම්

සේවකයන් වෙනුවෙන් ලබාදී තිබූ බයිසිකල් ණය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අනුව රු.539,712 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂාවට ලක්කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක බැංකු සංගම් 12 ක් විසින් ආයෝජනය සඳහා අධිකාරියට එවා තිබූ ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් ශේෂ හා අධිකාරියේ තොරතුරු අනුව සඳහන් වූ ශේෂ අතර එකතුව රු.2,281,381 ක වෙනසක් පැවති අතර එම වෙනස සැසඳීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු මූල්‍ය අංශයේ ගිණුම්වල දැක්වුණු ණය වර්ග තුනකට අදාල පොළී ආදායම එම ණය වර්ගවලට අදාල තත්ත්ව වාර්තාවල දැක්වුණු පොළී ආදායම සමඟ පැවති රු.178,083 ක වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී බැංකු සංගම් වෙනුවෙන් ඉඩම් හා ගොඩනැගිලි සඳහා වැයකර තිබූ වියදම උපලේඛන අනුව රු.623,817,076 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව රු.589,100,000 ක් වූයෙන් රු.34,717,076 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) සේවක පාරිභෝගික ණය | 660,709,153 | කේවල ශේෂ ලැයිස්තු |
| (ආ) දැයට කිරුළ - 2014 වෙනුවෙන් වූ වියදම් | 212,000,000 | මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරන බවට සනාථ කිරීම් |
| (ඇ) ගබඩාකුළී තැන්පතුව | 1,454,112 | කුළී හිමියාගෙන් මෑතකදී ලබාගත් ශේෂ සනාථ කිරීම් |
| (ඈ) "ඊ" සමෘද්ධි පුහුණු වියදම් | 1,621,093 | පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු, පැමිණීමේ ලේඛන |
| (ඉ) නිවාස ලොතරැයි දිනුම් ඇදීම සඳහා ප්‍රතිලාභී නාම ලේඛන සකස් කිරීමේ වියදම් | 1,429,912 | සකස්කළ ප්‍රතිලාභී නාම ලේඛන පිළිබඳ විස්තර |
| (ඊ) ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ තොග වෙනස | 437,287 | විස්තරාත්මක තොරතුරු |
| (උ) සංවර්ධන අංශ 7 ක වියදම් | 41,587,816 | සංවර්ධන වැඩසටහන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු |

(ඌ) සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම්වල 2012 සහ 2013 වර්ෂවල සිදුවී තිබූ මූල්‍ය වංචා/අක්‍රමිකතා 157 ක් සම්බන්ධයෙන් අදාල විස්තරාත්මක තොරතුරු හා පරීක්ෂණවල වර්තමාන ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(එ) ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ සමාලෝචිත වර්ෂයට අදාලව ජර්නල් සටහන් 36 ක් යොදා තිබුණද එම ජර්නල් සටහන්වලට අදාළ විස්තරාත්මක තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) සේවක යතුරුපැදි ණය

නිලධාරීන් 08 දෙනෙකු වෙත ප්‍රදානය කර තිබූ ණය වලින් 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිට හිඟව පැවති එකතුව රු.345,661 ක ශේෂයක් 2014 නොවැම්බර් වන විටත් අයකරගෙන නොතිබුණි.

**(ආ) සේවක පාරිභෝගික ණය**

(i) නියැදි පරීක්ෂාවට ලක්කළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ණයලාභීන් 1,417 කින් ණයලාභීන් 118 දෙනෙකුගෙන් 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතුව පැවති එකතුව රු.983,678 ක ණය ශේෂ අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) දිස්ත්‍රික්ක 05 කට අදාල ණය ශේෂ සම්බන්ධයෙන් 2009 වර්ෂයෙන් පසු කේවල ගිණුම් ශේෂ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

**(ඇ) සේවක නිවාස ණය**

(i) 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මියගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය එකතුව රු.1,588,423 ක් 2014 ජුනි වන විටත් අයකරගෙන නොතිබුණි.

(ii) අධිකාරියේ සේවයෙන් පහකළ නිලධාරින් 04 දෙනෙකුගෙන් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව පැවති රු.1,547,858 ක ණය ශේෂ 2014 ජුනි වන විටත් අයකරගෙන නොතිබුණි.

(iii) විවිධ හේතූන් මත සේවය අවසන් කර තිබූ නිලධාරින් 07 දෙනෙකුගෙන් 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අයවිය යුතුව තිබුණු රු.1,819,702 ක ණය ශේෂ අයකරගෙන නොතිබුණි.

**(ඈ) සේවක ආපදා ණය**

(i) නිලධාරින් 20 දෙනෙකුගෙන්, ණය වාරික වශයෙන් සමාලෝචිත වර්ෂයේදී අයකරගත යුතු එකතුව රු.337,625 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී නිලධාරින් 12 දෙනෙකුට අදාල එකතුව රු.484,303 ක ණය ශේෂ හා සමාලෝචිත වර්ෂයේදී නිලධාරින් 4 දෙනෙකු වෙත ප්‍රදානය කර තිබූ එකතුව රු.744,810 ක් වූ ණය වලින් එකම වාරිකයක් හෝ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරින් 72 දෙනෙකුගෙන් වැඩිපුර අයකරගෙන තිබූ එකතුව රු.679,346 ක් 2014 ජුනි වන විටත් අදාළ නිලධාරින් වෙත නිරවුල් කර නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල නොපියවූ අත්තිකාරම් - දිස්ත්‍රික් ලේකම් ලෙස රු.4,981,334 ක් දක්වා තිබූ අතර මෙම ශේෂයේ 1997 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිදහස් කර තිබුණු අත්තිකාරම් පැවතුණි. මේ තුළ වැඩ තහනම් කළ, මියගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරින්ට ලබාදුන් අත්තිකාරම් මෙන්ම අධිකාරියේ අසාර්ථක ව්‍යාපෘති වෙනුවෙන් ලබාදුන් අත්තිකාරම් ද විය. දීර්ඝ කාලයක් තිස්සේ නොපියවී පැවති මෙම අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට අධිකාරිය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව** | | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | සේවකයෙක් ඉල්ලා අස්වීම, විශ්‍රාමයාම, මියයාම හෝ සේවයෙන් පහකිරීම ඇතුළු කවර හේතුවකදී හෝ සේවය නතර කර ඇතිවිට එදින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික දීමනා ගෙවිය යුතු වුවත් සලකා බැලූ සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මාස 03 සිට අවුරුදු 05 දක්වා ප්‍රමාදවී ගෙවීම් සිදුකළ අවස්ථා 30 ක් නිරීක්ෂණය විය. |
| (ආ) | 2013 ජුනි 05 දිනැති අංක පී සී එම් ඩී/ පීආර් / 2013 ජනාධිපති කාර්යාලයීය චක්‍රලේඛ හා අංක පී එෆ්/එෆ් එස්/ඒ/ වාහන/2009 හා 2010 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 03,05 ඡේද | අළුත්වැඩියා කළ යුතු තත්ත්වයට පත්වී තිබුණු වාහන සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුළත අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අළුත්වැඩියාවට හෝ අපහරණයට අවශ්‍ය කටයුතු කළයුතු වුවද, අධිකාරියේ වාහන 10 ක් කාර්මික දෝෂයන්ට ලක්වී මාස 03 සිට මාස 43 දක්වා කාලයක් ගතවී තිබුණද ඒ සම්බන්ධව චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (2) | (i) අවස්ථා 25 කදී එකතුව රු.1,214,939 ක අත්තිකාරම් මාණ්ඩලික නොවන නිලධාරීන් 17 දෙනෙකුට නිකුත් කර තිබුණි.<br>(ii) නිලධාරීන් 34 දෙනෙකුට අවස්ථා 161 ක දී දෙන ලද එකතුව රු. 6,671,593 ක අත්තිකාරම් දින 05 සිට දින 256 දක්වා කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. |
| (ඈ) | 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ප්‍රසම්පාදන අත්පොතේ අංක 9 හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අදාල කාර්ය සඳහාම ටෙන්ඩර් මණ්ඩලයක් පත්කළ යුතු නමුත් සමෘද්ධි බැංකු සංගම් සඳහා රු.13,548,207 ක් වටිනා පරිගණක මිලදී ගැනීමේදී එය අධිකාරියේ පොදු ටෙන්ඩර් මණ්ඩලයක් මඟින් ඇගයීම් කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,090,472,562 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.771,327,538 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.319,145,024 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. කාර්යමණ්ඩල පිරිවැය හැර අනෙකුත් මෙහෙයුම් වියදම් රු.317,468,990 කින් හෙවත් සියයට 32 කින් අඩුවී තිබුණ ද කාර්ය මණ්ඩල පිරිවැය රු.715,099,144 කින් හෙවත් සියයට 8 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**
**---------------------------**

**4.1 කාර්යසාධනය**
**------------------**

**4.1.1 සැලසුම් කළ ඉලක්ක ලඟාකර ගැනීමේ ප්‍රගතිය**
**--------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ සංවර්ධන අංශ 10 ක් විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සැලසුම් කළ වැඩසටහන් 2830 කින් වැඩසටහන් 2300 ක් හෙවත් සියයට 81 ක් පමණක් ඉටුකර තිබුණි. නමුත් ඒ සඳහා වෙන්කර තිබූ රු. මිලියන 150 කින් රු. මිලියන 134 ක් හෙවත් සියයට 89 ක් වියදම් දරා තිබුණි.

(ආ) අධිකාරියේ අංශ 3 ක් විසින් රු. මිලියන 2.74 ක ප්‍රතිපාදන මත ඉටු කිරීමට සැලසුම් කළ වැඩසටහන් 22 ක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකිරීමට අපොහොසත්වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**
**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ආයතන දෙකක ආයෝජනය කර තිබුණු රු.5,250,000 ක් හා රු.750,000 ක් සඳහා පිළිවෙළින් 2003 වර්ෂයේ හා 2008 වර්ෂයේ සිට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස වෙනුවෙන් එකතුව රු.3,457,500,000 ක් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට නිදහස් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම මුදල් නිදහස් කිරීම, ආපසු අයකරගැනීම හා අයකරගතයුතු පොළිය පිළිබඳව මුදල් නිදහස් කිරීමට පෙර භාණ්ඩාගාරය හෝ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සමග ලිඛිත එකගතාවයකට එළඹ නොතිබුණි.

(ii) සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් හා බැංකු මූල්‍ය අංශයේ අනෙකුත් අරමුදල් හා සංචිත උපයෝගී කරගෙන සිදුකර තිබූ ආයෝජන, කල්පිරීමට පෙර වට්ටම් කිරීමෙන් ඉහත මුදල සම්පාදනය කරගෙන තිබුණු අතර ඒ හේතුවෙන් ආයෝජන සඳහා නොලැබුණු පොළී ප්‍රමාණය රු.169,139,772 ක් විය.

(iii) සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබූ රු.3,457,500,000 ක මුළු මුදලින් 2014 නොවැම්බර් වන විට රු.2,618,639,772 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණු අතර මෙම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) මෙම අරමුදල් නැවත ආයෝජනය කිරීමෙන් 2013 දෙසැම්බර් 31 දින වනවිට අධිකාරියට ලබා ගත හැකිව තිබූ ආදායම දල වශයෙන් රු. 50,324,000 ක් අහිමි වී තිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකකට අයත් සමෘද්ධි බැංකු සංගම් 11 ක් විසින් ආයෝජනය සඳහා සමෘද්ධි මහ සංගමයට යවන ලද එකතුව රු.20,951,830 ක් අදාළ මහ සංගම් විසින් ආයෝජනය කිරීම සඳහා දින 5 සිට දින 17 දක්වා වූ කාලයක් ගතකර තිබුණි.

(ඈ) 2001 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සිදුවී තිබුණු රථ වාහන අනතුරු 13 ක් සඳහා අයකර ගත යුතුව තිබූ රු.312,949 ක රක්ෂණ වන්දි මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අධිකාරිය විසින් පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන අක්කර 21 රූඩ් 02 පර්චස් 37.25 ක් වූ නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ පර්චස් 91.29 ක් වූ බිම් කොටස් 06 ක අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා අධිකාරිය කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2012 ජනවාරි 01 දින පැවති 232 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී වර්තමාන තක්සේරු වටිනාකම අයකරගෙන පදිංචිකරුවන්ට ඉඩම පැවරීමට තීරණය කර තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) දිවයින පුරා පිහිටි සමෘද්ධි බැංකු සංගම්වල දත්ත පරිගණක ගතකිරීම හා සියළුම බැංකු සංගම් ජාල ගතකිරීම සඳහා "විවෘත මූලාශ්‍ර බැංකු විසඳුමක්" නැමති පරිගණක මෘදුකාංගය සංවර්ධනය, සැපයීම, ස්ථාපනය හා ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා 2012 පෙබරවාරි 29 දින සැපයුම්කරුවෙකු සමඟ රු.12,750,000 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව අදාල කොන්ත්‍රාත්තුව මාස 12 ක් ඇතුළත නිමකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වන විට රු.7,165,000 ක් සැපයුම්කරුට ගෙවා තිබුණ ද අදාළ කාර්යය අවසන් කර නොතිබුණි.

(උ) වර්ෂ 10 කට අධික කාලයක සිට ආයතන 4 කින් අයවිය යුතුව තිබූ එකතුව රු.167,735,462 ක ලැබිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඌ) දැයට කිරුළ - 2014 වැඩසටහන වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් නැවත ප්‍රතිපූර්ණය කරන පදනම මත සමාලෝචිත වර්ෂයේදී සමෘද්ධි අරමුදලෙන් රු.මිලියන 212 ක් දිස්ත්‍රික්ක 3 ක් වෙනුවෙන් වියදම් කර තිබුණි. එසේ වුවද මෙම මුදල් 2014 ජුනි වන විටත් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස්වීමට අයදුම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අධිකාරියට අයවීමට තිබූ එකතුව රු.336,908 ක මුදල අයකරගැනීමකින් තොරව ඔවුන් සේවයෙන් නිදහස් කර තිබුණි. පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව ඔවුන්ට හිමි පාරිතෝෂිකයෙන් මෙම මුදල අයකරගැනීමට බලයක් නොමැති වුවද එසේ අයකර ගැනීමේ අපේක්ෂාවෙන් 2013 ජුලි 05 දින සිට මෙම නිලධාරීන් සේවයෙන් නිදහස් කර තිබුණ ද 2014 මැයි වන විටත් අදාළ මුදල අයකරගෙන නොතිබුණි.

(ආ) පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියත් ඒකාබද්ධව සුනාමි විපතට පත් ජනතාවගේ විදුලි සංදේශ පහසුකම් නගාසිටුවීම උදෙසා මෝල්ටා රජයේ ආධාර යටතේ ආරම්භ කළ ග්‍රාමීය සන්නිවේදන මධ්‍යස්ථාන පිහිටුවීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබාදී 2011 වර්ෂයේ සිට අධිකාරියේ පොදු තැන්පත් ගිණුමේ පැවති රු. 581,211 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

**(ඇ) විදුලි අත්වැල ණය පහසුකම් වැඩසටහන**

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභී ජනතාවට විදුලි සේවාව ලබාදීම අරමුණු කරගෙන විදුලි අත්වැල ව්‍යාපෘතිය යටතේ පහසුකම් සැලසීම වෙනුවෙන්, ලංකා විදුලි බල මණ්ඩලය වෙත රු. මිලියන 3,000 ක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා ලංකා විදුලි බල මණ්ඩලය අතර 2010 වර්ෂයේදී එළඹි ගිවිසුම ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. මිලියන 1,080 ක ණය පහසුකම් ලංකා විදුලි බල මණ්ඩලය වෙත මුදාහැර තිබුණු අතර 2014 අප්‍රේල් වන විට මෙම ප්‍රමාණය රු. මිලියන 1,300 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉහත ගිවිසුමේ කොන්දේසි අංක 05 ප්‍රකාරව, සේවා සැපයීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා අධිකාරිය වෙත ලබාගැනීමෙන් අනතුරුව ණය පහසුකම් මුදාහැරිය යුතු වුවද, මුදාහැර තිබුණු රු. මිලියන 1,300 න් රු. මිලියන 350.1 කට අදාළව දිස්ත්‍රික්ක 22 ක විස්තර සමාලෝචිත වර්ෂයට අදාලව පමණක් ගෙන්වාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. එසේම 2011 හා 2012 වර්ෂවලට අදාළ ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර අධිකාරිය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ගිවිසුමේ කොන්දේසි අංක 6 ප්‍රකාරව ඉහත (i) ඡේදයේ සඳහන් දිස්ත්‍රික්ක 22 ක තොරතුරුවලින් 2014 ජුනි වන විටත් අධිකාරිය විසින් තහවුරු කරගෙන තිබුණේ දිස්ත්‍රික්ක 05 ක තොරතුරු පමණක් විය. ඒ අනුව ලංකා විදුලි බල මණ්ඩලය ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව සේවා සැපයුම් ලබාදුන් ප්‍රතිලාභීන් 67,677 කින් තහවුරු කරගෙන තිබුණේ ප්‍රතිලාභීන් 1,968 ක් හෙවත් සියයට 2.9 ක් පමණක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(iii) ගිවිසුමේ කොන්දේසි අංක 11 ප්‍රකාරව වැඩසටහනේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා දෙපාර්ශවයේ රැස්වීම් මාස දෙකකට වරක් පවත්වා නොතිබුණු අතර, ලංකා විදුලි බල මණ්ඩලයේ සභාපතිවරයාගේ කැඳවීමෙන් 2014 ජනවාරි 09 දින පැවති විශේෂ සාකච්ඡාවේදී එකග වූ පරිදි, දෙපාර්ශවයේ නිලධාරින්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් මේ සඳහා ක්‍රමවත් වැඩසටහනක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) ඉහත විශේෂ සාකච්ඡාවේදී එකඟවූ පරිදි ලංකා විදුලි බල මණ්ඩලය විසින් ප්‍රතිලාභීන්ගෙන් අයකරගත් කොටස් මුදල් සමෘද්ධි අධිකාරිය වෙත ප්‍රේෂණය කළයුතු වුවද, 2014 අප්‍රේල් මාසය වන විටත් එසේ ප්‍රේෂණය කර තිබුණේ දිස්ත්‍රික්ක දෙකකට අදාල රු.149,000 ක් පමණක් වූ අතර, මෙම මුදල්වලට අදාල ප්‍රතිලාභීන්ගේ ප්‍රමාණවත් විස්තර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම මුදල්ද අදාල සමෘද්ධි බැංකු සංගම් වෙත ලබාදී නොතිබුණි.

(v) ලංකා විදුලි බල මණ්ඩලයෙන් අයකර ගන්නා ණය වාරික වලට අදාල සියයට 10 ක පොළියෙන් සියයට 2 ක ප්‍රමාණයක් අදල සමෘද්ධි බැංකු සංගම් වෙත ලබාදීමට නියමිතව තිබුණද, 2014 අප්‍රේල් මාසය දක්වා අයකර ගෙන තිබූ රු.128,179,758 කින් කිසිදු මුදලක් සමෘද්ධි බැංකු සංගම් වෙත ලබාදී නොතිබුණි. එසේම ගිවිසුමේ අංක 10 ප්‍රකාරව ප්‍රතිලාභීන්ගෙන් ණය වාරික අයකර ගැනීම සම්බන්ධයෙන් වූ තොරතුරු එකඟවී තිබූ ආකාරයට ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් ලබාගෙන නොතිබුණි.

(vi) ඉහත කරුණු අනුව සමස්ථ වැඩසටහන අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවා නොමැති බව නිරීක්ෂණය විය.

**(ඈ) සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරිකිරීම් සඳහා ප්‍රතිලාභ ගෙවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බැංකු මූල්‍ය අංශයේ ආයෝජනය සඳහා ලැබී තිබුණු අරමුදල්වලට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රතිලාභ තීරණය කිරීමේදී රු. මිලියන 13,553 ක් හෙවත් මුළු ආයෝජන වලින් සියයට 72 ක් වූ අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල් සඳහා හිමි ආයෝජන ආදායම් රු. මිලියන 1,655 කින් ප්‍රතිලාභීන් වෙත ගෙවා තිබුණේ රු. මිලියන 836 ක් හෙවත් සියයට 51 ක් පමණක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායම්වලින් සියයට 44 ක් බැංකු මූල්‍ය අංශයේ වියදම් සඳහා අවකරණය කර තිබූ අතර, මුළු ආයෝජන අරමුදල්වලින් සියයට 72 ක් හිමි අනිවාර්ය ඉතිරිකිරීම් සඳහා ලබාදී තිබුණේ වර්ෂයේ මුළු ආයෝජන ආදායමෙන් සියයට 38 ක් පමණක් විය.

(iii) අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල් වෙනුවෙන් කළ ගෙවීම් හැරුණු විට ආයෝජනය සඳහා ලද අනෙකුත් අරමුදල් සඳහා ද සියයට 11 ක් ද ඉතිරි රු. මිලියන 161 ක් හෙවත් මුළු ආයෝජන ආදායමෙන් සියයට 7 ක් ද අධිකාරියේ රඳවා ගැනීමට කටයුතු කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ පොළී ඉපයීම් අනුපාතය ගණනය කිරීමේදී, සේවක ණය පොළී ආදායම් රු. මිලියන 185 ක් හා ලැබූ ලාභාංශ රු. මිලියන 11 ක් උපයෝගී කරගෙන නොතිබුණි.

(v) ශුද්ධ පොළී අනුපාතය ගණනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ නොවන රු. මිලියන 46 ක මුදලක් හා තථ්‍ය වියදමට වඩා රු. මිලියන 386 ක් වර්ෂයේ ආදායමෙන් අඩුකර තිබුණි.

(vi) 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආයෝජන ප්‍රතිලාභවලින් සියළු වියදම් ද අඩුකළ පසු අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල් වෙනුවෙන් ගෙවිය යුතු එහෙත් එසේ නොගෙවූ මුදල රු. මිලියන 1,549 ක් වූ අතර, මෙම මුදල් සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත සෘජුවම ලබාදීමේ වැඩ පිළිවෙලක් 2014 ජුනි වන විටත් සකස් කර නොතිබුණි.

(ඉ) මිහිජය ණය යෝජනා ක්‍රමය යටතේ සියයට 10 හා සියයට 8 පොළී අනුපාත යටතේ ප්‍රතිලාභීන්ට ලබාදෙන ණයවලට අදාළ පොළී සහනයන්ට අදාලව සමෘද්ධි බැංකු සංගම් 09 ක් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් ලබා දිය යුතු එකතුව රු. 1,689,811 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලබාදී නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඊ) සමෘද්ධිලාභීන්ගේ හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත එළවලු, මල් පැල හා පළතුරු පැල නිෂ්පාදනයට ආරක්ෂිත ගෘහ ඉදිකිරීම සඳහා නැවත අයකර නොගන්නා පදනමින් එක් අයෙකුට රු. 80,000 බැගින් 2012 වර්ෂය වෙනුවෙන් පරීක්ෂාවට ලක්කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක ප්‍රතිලාභීන් 30 දෙනෙකුට එකතුව රු.2,220,000 ක් ලබා දී තිබුණි. එහිදී දිවිනැගුම ජාතික වැඩසටහනේ ප්‍රධාන අරමුණු ඉටුවන අයුරින් ප්‍රදේශයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි, පැල තවාන් සකස් කර නොතිබුණු අතර අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන්ට මෙම ණය ලබාදීමට කටයුතු කර නොතිබූ බව ද නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(උ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකකට අයත් බැංකු සංගම් 15 ක එකතුව රු.4,413,423 ක බොල් ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඖ) ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රදානය කරනු ලබන ණය මුදල්වලින් සියයට 50 ක් ආපසු අයකර ගැනීමේ පදනම මත ප්‍රතිලාභීන් වෙත ලබා දෙනු ලබන ණය පහසුකම් මාසික වාරික 10 කින් චක්‍රීය අරමුදලට අයකර ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ලබාදී තිබූ ණය වලින් එකතුව රු.4,923,484 ක ණය ශේෂ 2014 නොවැම්බර් වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඓ) සමෘද්ධි කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණු ක්ෂුද්‍ර මූල්‍ය බැංකුකරණය පිළිබඳ කුසලතා වර්ධන සහතික පත්‍ර පාඨමාලා 20 ක් සඳහා රු.19,848,775 ක් වියදම් දරා තිබුණු අතර පුහුණු සැසි පැවැත්වීම පිළිබඳ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද, පුහුණු සැසි දෙකකදී සම්පත්දායක දීමනා සඳහා එකඟවූ මුදලට වඩා රු.120,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැංකු ලිපි ද්‍රව්‍ය තොග ගබඩා කිරීම සඳහා කුලියට ගෙන තිබූ ජාවත්ත සළුසල ගබඩාවේ තිබූ ලිපි ද්‍රව්‍ය තොග 2010 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම ඉවත් කරගෙන තිබුණද, ගබඩාව සඳහා ලබාදී තිබූ කුළී තැන්පතුවෙන් රු.1,454,112 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආපසු අයකර ගෙන නොතිබුණි.

(ආ) දීප ව්‍යාප්ත පදනමක් මත හඳුනාගත් විගමණික ශ්‍රමිකයින්ට නිවාස තනාගැනීම වෙනුවෙන් ආධාර උපකාර කිරීමේ අරමුණෙන් රටවිරු නිවාස ආධාර වැඩසටහන සඳහා අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ 2012 මාර්තු 07 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමෙහි එකඟතා අංක 10 ප්‍රකාරව, මෙම වැඩසටහනට දායකවීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අධිකාරියේ රු. මිලියන 100 ක තැන්පතුවක් ස්ථාපිත කිරීමටත් ඒ සඳහා අදාළ වන පොළිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලබාදීමටත් එකගතාවයක් ඇති කරගෙන තිබුණි. එහෙත් මෙම අරමුදල ස්ථාපිත කිරීම තුළින් අධිකාරියට අත්වන ප්‍රතිලාභ පිළිබඳව හෝ ණය ගෙවීම් පැහැර හරින ණයලාභීන්ගෙන් හිඟ ශේෂ මෙම අරමුදලෙන් ආවරණය කරගත හැකිද යන්න පිළිබඳව හෝ එකඟතාවයකට පැමිණීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඇ) සමෘද්ධි ප්‍රතිලාභීන්ට හිමි ආයෝජන ආදායම් වලින් එක් බැංකු සංගමයකින් වර්ෂයකට රු.10,000 ක් බැගින් අවකරණය කර ගොඩනගා තිබුණු බැංකු සංගම් ප්‍රවර්ධන හා ප්‍රචාරණ අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළ වැය කරන ලද රු.19,790,806 ක වියදම් තුළ රු. මිලියන 9 කට වැඩි මුදලක් අරමුදලේ අරමුණුවලට පටහැනි වෙනත් කාර්යයන් සඳහා වැයකර තිබුණි.

## 4.5 දෘෂ්‍ය අක්‍රමිකතා

අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබුණු රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විශ්‍රාම ගිය නිලධාරියෙකු ලෙස ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර නියමිත සම්මුඛ පරීක්ෂණයකින් තොරව අධිකාරියේ දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරී තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රාජ්‍ය සේවයෙන් තාවකාලිකව මුදාහැර සිටි මෙම නිලධාරියාට 2007 ජුලි සිට 2013 නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් ලෙස රු.2,450,815 ක් ඔහුගේ නිත්‍ය සේවා ස්ථානයෙන් ගෙවා තිබුණු අතර ඔහුගේ නිත්‍ය සේවා ස්ථානයෙන් ප්‍රමාණවත් තහවුරු

කිරීම් ලබානොගෙන ඉහත කාලපරිච්ඡේදය සඳහා අධිකාරියෙන්ද, රු.2,630,765 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ii) මීට අමතරව යුද්ධයෙන් අවතැන් වූ සහ ජන ජීවිතය අඩාලවූ වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 28 දෙනෙකු වෙත පහසුකම් සැලසීම සඳහා බිඳුණු දැත් සවිමත් කිරීමේ සමාජ සත්කාරක වැඩසටහන යටතේ ලබාදුන් රු.1,976,990 ක මුදලක් අවභාවිතා කර තිබුණි.

(iii) ඉහත කරුණු සම්බන්ධයෙන් අදාල නිලධාරියාට එරෙහිව විනය/නීති පියවර ගැනීමට හා මුදල් ආපසු අයකරගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

**4.6 අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාජයේ විවිධ අවාසි සහගත තත්ත්වයන් හමුවේ අසරණභාවයට පත්වන පුද්ගලයින්ට උපකාර කිරීම අරමුණු කරගෙන පිහිටුවා තිබුණු සමාජ සංවර්ධන අරමුදල සඳහා සමෘද්ධි කොඩි අලෙවියෙන්, දානපතින්ගේ මුදල් ආධාර හා වෙනත් නිර්මාණශීලී වැඩසටහන් තුළින් රැස්කරගන්නා අරමුදල් එම කොට්ඨාශය තුළම අරමුණුගත කාර්යයන් සඳහා වැය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 321 ක් සතුව පැවති රු.160,787,882 ක් අදාල අරමුණු සඳහා වැය නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් රු.5,000 බැගින් රැස්කර පිහිටුවා තිබූ ජාතික සමාජ සංවර්ධන අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ශේෂය රු.2,947,206 ක් වූ අතර එම මුදල් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා නොකර පොදු තැන්පත් ගිණුමේ නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ධාවනය කළ හැකි තත්ත්වයේ පවතින අධිකාරියට අයත් මෝටර් රථයක් වර්ෂයකටත් අධික කාලයක සිට භාවිතයට නොගෙන 2014 ජුනි වන විටත් සෙත්සිරිපාය පරිශ්‍රයේ නවතා තිබුණි.

**4.7 හඳුනාගන්නා ලද පාඩු**

----------------------

මූල්‍ය වංචා / අක්‍රමිකතා හේතුවෙන් වැඩ තහනම් කරන ලද නිලධාරියෙකු සහ සේවයෙන් පහකරන ලද නිලධාරිණියන් දෙදෙනෙකු විසින් අධිකරණයේ ගොනු කරන ලද නඩු 03 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අධිකාරියේ පරිපාලනමය දුර්වලතා හේතුවෙන් කම්කරු විනිශ්චය සභා නියෝග මත රු.784,384 ක් සේවක වන්දි ලෙස ගෙවා තිබුණි.

**4.8 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

-----------------------------------------------------------------

විගණනය වෙත ලද තොරතුරුවලට අනුව, ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දිස්ත්‍රික්ක 17 කට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 228 ක පිහිටි සමෘද්ධි බැංකු සංගම් 744 ක් වෙනුවෙන් රු. 657,651,017 ක සහ දිස්ත්‍රික්ක 16 කට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 142 ක පිහිටි සමෘද්ධි මහ සංගම් 143 ක් වෙනුවෙන් රු.249,770,480 ක වියදමක් අධිකාරිය විසින් වැයකර තිබුණි. එම ඉඩම්වල භූමි ප්‍රමාණයන් හඳුනාගෙන අධිකාරිය වෙත පවරා ගැනීමට හෝ දිගුකාලීන බදු පදනම මත ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇති බව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2013 සැප්තැම්බර් 30 දින මා වෙත වාර්තා කර තිබුණ ද එම කටයුතුවල ප්‍රගතිය පිළිබඳ පැහැදිලි කිරීම් 2014 ජුනි වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**4.9 කාර්යමණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) තනතුරු හැර ගිය නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම**

(i) අධිකාරියේ සමෘද්ධි සංවර්ධන නිලධාරි තනතුරේ සේවයේ නියුතුව සිට සේවයේ ස්ථිර කිරීමට ප්‍රථම පරිවාස කාලය තුළ නිලධාරින් තිදෙනෙකු සහ සේවයෙහි ස්ථිර කර සිටි එක් නිලධාරියෙකු තනතුර හැරගොස් තිබුණි. ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති හා රජයේ වෙනත් රෙගුලාසි උල්ලංඝණය කර වර්ෂ 4 සිට වර්ෂ 12 ක කාල පරාසයකට පසු මෙම නිලධාරින් නැවත සේවයේ පිහිටුවා තිබුණු අතර සේවය හැර යන අවස්ථාවේ ලබමින් සිටි වැටුප් පරිමාණවලම නැවත පිහිටුවා වැටුප් වර්ධක ලබාදීමට ද කටයුතු කර තිබුණි.

(ii) සේවයේ ස්ථිර කිරීමට පෙර තනතුරු හැර ගිය නිලධාරීන් තිදෙනකු වර්ෂ ගණනාවකට පසු නැවත සේවයට බඳවා ගැනීමේදී, ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 8:1 වගන්තිය හා කාර්ය පටිපාටික රීති 164 ප්‍රකාරව, පෙර සේවා කාලය වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් ලැබීමට හිමිකම් නොමැති වුවද නැවත සේවයට බඳවාගැනීමේදී අධිකාරියේ පෙර සේවා කාලය ද අදාළ කරගෙන තිබුණු අතර මෙම නිලධාරින් නැවත සේවයට බඳවාගැනීමට කටයුතු කළ නිලධාරින්ට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ආ) ප්‍රධාන ලිපිකරු තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධිකාරියේ ප්‍රධාන ලිපිකරු තනතුරු සඳහා නිලධාරීන් 06 දෙනෙකු බඳවාගැනීමේදී අනුමත බඳවාගැනීමේ පරිපාටියට, ආයතන සංග්‍රහයේ හා කාර්ය පටිපාටික රීතිවල නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ii) මෙම බඳවාගැනීම් සඳහා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 5:2:6 ප්‍රකාරවූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණි.

(iii) මෙම බඳවාගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබාදිය යුතු ආකාරය දැක්වෙන නිර්නායකයන් අධිකාරිය විසින් පිළියෙල කර නොතිබුණු අතර ලබාදුන් ලකුණු පිළිබඳ ලේඛනවල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iv) අනුමත බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ ලිපිකාර සේවයෙන් පරිබාහිර නිලධාරිණියකට ද ප්‍රධාන ලිපිකරු තනතුරක් ලබා දී තිබුණි.

(ඇ) ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක සමාලෝචිත වර්ෂය තුළදී සිදුකළ නියැදි පරීක්ෂාවලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) බියගම සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් සමෘද්ධි බැංකු සංගම් දෙකක 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිලධාරින් 27 දෙනකු විසින් සිදුකර තිබූ රු.6,159,674 ක මූල්‍ය වංචා සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින් 06 දෙනෙකුට අදාළ විනය පරීක්ෂණ නිමකර විනය නියෝග නිකුත් කිරීම සිදුකර නොතිබුණි.

(ii) ඉහත චෝදනාලාභීන් අතර රු.117,000 ක මූල්‍ය වංචාවක් ඇතුළු චෝදනා 5 ක් ගොනුකර තිබුණු නිලධාරිණියකට එරෙහිව විධිමත් විනය පරීක්ෂණය සඳහා පරීක්ෂණ නිලධාරිවරයෙකු පත්කරන අවස්ථාව වන විටත් 2011 වර්ෂයේදී අදාල නිලධාරිණිය තනතුර හැරගොස් තිබුණි. අදාල නිලධාරිණියට එරෙහිව විනය නියෝග ක්‍රියාත්මක කර නොතිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික දීමනා වශයෙන් රු.128,970 ක් ගෙවා තිබුණි.

(iii) ඉහත චෝදනා ලද එක් සමෘද්ධි කළමනාකාරවරියකට එරෙහිව විනය පරීක්ෂණයක් සිදු කරමින් පවතින බැවින් එහි තීන්දුව ලැබෙන තෙක් ඇය මුදල් ගණුදෙනු සිදුනොවන ස්ථානයක රාජකාරි සඳහා අනුයුක්ත කරන මෙන් ලබාදී තිබූ උපදෙස්වලට පටහැනිව සමෘද්ධි බැංකු සංගමයක කළමණාකරු ලෙස අනුයුක්ත කර තිබුණි.

(ආ) අධිකාරියේ කාර්යමණ්ඩලය විසින් විනය කඩකිරීම් සම්බන්ධයෙන් ගනුලබන ක්‍රියාමාර්ග ඇතුළත් විධිමත් ලේඛනයක් සහ එක් එක් පරීක්ෂණයන්ට අදාල වියදම වෙනම හඳුනාගත හැකිවන පරිදි සකස් කළ ලේඛනයක් නඩත්තු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ගන්නා ලද විනය ක්‍රියාමාර්ගවල සමස්ථ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. තවද, විනය පරීක්ෂණ අවසානයේ නිකුත් කරණු ලබන විනය නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් ලේඛන සකස් කිරීමට කටයුතු ආරම්භ කර ඇති බවත් අධීක්ෂණ කටයුතු සිදු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2013 සැප්තැම්බර් 30 දින දන්වා තිබුණ ද එම කාර්යයන් යාවත්කාලීනව සිදුකර නොතිබුණි.

**4.10 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් 2011 වර්ෂයේදී ලබාගෙන තිබුණු වාහන 06 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ප්‍රයෝජනයට නොගෙන සෙත්සිරිපාය භූමියේ නවතා තිබුණි.

(ආ) අධිකාරිය විසින් බාහිර ආයතනවලින් ලබාගත් වාහන 12 ක් පවරා ගැනීමට සහ වෙනත් අමාත්‍යාංශයක් වෙත මුදාහැර තිබුණු වාහනයක් ආපසු ලබාගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතුකර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අවස්ථා ගණනාවකදී සංශෝධනය කර තිබුණු අතර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම අධිකාරියේ කටයුතු පිළිබඳව සිදුකළ පූර්ව පුරෝකථනයක් ලෙස සලකා නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන වැඩසටහන්වලට අනුව අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශවල කටයුතු පිළිබඳව සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**5.3 අයවැය පාලනය**

-------------------

අයවැය ලේඛනගත වියදමට වඩා තථ්‍ය වියදම සියයට 138 කින් වැඩිවී තිබුණු බව නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5.4 විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම**

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කර තිබුණු විගණන විමසුම් 06 ක් හා ඉකුත් වර්ෂවලට අදාලව නිකුත් කර තිබුණු විගණන විමසුම් 07 ක් සඳහා පිළිතුරු ලබා දීමට 2014 නොවැම්බර් වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානය යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අරමුදල් පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) සේවක කළමනාකරණය
(ඉ) ණය කළමනාකරණය